ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2015

# චිත්‍ර කලාව I

11 ශ්‍රේණිය | කාලය පැය 1 යි.

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 05 දක්වා දී ඇති රූප සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.



01 මෙම සිතුවමෙන් .............................................. නම් මිසර කලාවෙන් හමුවූ සිතුවම දැක්වේ.

02 වංශාධිපතියකු ඔරුවක නැගී .............................................. දඩයම් කරන අයුරු පෙන්වයි.

03 මිසර කලාවට ආවේණික වූ .................................................................. පැළැටි මෙහි දැක්වේ.

04 මෙහි සිතුවම් අතර ........................................ සත්ව රූප තාත්විකව නිරූපණය කර ඇත.

05 මිසර රූපාක්ෂර ........................................................................................ යනුවෙන් ද හඳුන්වයි.

- අංක 06 10 දක්වා වූ ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

06 අනුරාධපුර ගෘහ නිර්මාණ අතර සුවිසල් මහල් ගොඩනැගිල්ලක් වූ ලෝවාමහා ප්‍රාසාදය

(1) උපෝසතාගාරයකි. (2) පධානඝරයකි.

(3) පටිමාඝරයකි. (4) බෝධිඝරයකි.

07 යුරෝපීය චිත්‍ර ශිල්පියෙකු වූ පෝල් සෙසාන්

(1) පශ්චාත් උපස්ථිතිවාදියෙකි. (2) ඝනිකවාදියෙකි.

(3) තාත්විකවාදියෙකි. (4) උපස්ථිතිවාදියෙකි.

08 ඇම්බැක්ක දේවාලයේ දැව කණු හා සම්බන්ධ පේකඩ විචිත්‍රවත් කිරීමට යොදාගත් සැරසිලි ඒකක වනුයේ,

(1) බෙරලිය හා සපුමල (2) නෙළුම් හා බිනර මල

(3) කතිර මල හා බිනර මල (4) වැටකේ හා සපු මල

09 ගුප්ත යුගයේ නිර්මාණයක් වූ සාරානාත් බුදු පිළිමයේ දෑතින් නිරූපණය වන්නේ,

(1) භූමි ස්පර්ශ මුද්‍රාවයි. (2) අභය මුද්‍රාවයි.

(3) විතර්ක මුද්‍රාවයි. (4) ධම්මචක්ක මුද්‍රාවයි.

10 ආරක්ෂාව, සෞභාග්‍ය, වස්තු ආරක්ෂාව වැනි සංකල්ප සංකේතවත් කරන පෞරාණික කැටයම වනුයේ,

(1) මුරගල (2) සඳකඩ පහණ (3) කොරවක් ගල (4) බහිරව රූව

● අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

11 පාර්ලිමේන්තුවේ බලාධිකාරය සංකේතවත් කරන සෙන්කෝලය සැලසුම් කළ ශිල්පියා කවුරුන්ද? ..........

12 ''සිරිබිරිස්'' නම් සුප්‍රකට කාටූන් චිත්‍ර නිර්මාණයේ පුරෝගාමියා කවුරුන් ද?

..........

13 ස්වර්ගය, මනුලොව, නිරය නිරූපණය කරන සිස්ටයින් දෙව්මැඳුරේ දක්නට ඇති සුවිසල් ෆ්‍රෙස්කෝ සිතුවම හඳුන්වන නම කුමක්ද? ..........

14 සාංචි ස්තූපය හා සම්බන්ධ ගල්වැට හා තොරණ ඉදිකරන ලද්දේ කිනම් රාජ්‍ය සමයකද? ..........

15 ''මල් සුවඳ, සුදු වලාකුළු, චන්ද්‍රකාන්ත පාෂාණය ආදී සිතුවම් නිර්මාණය කළ ජාත්‍යන්තර කීර්තියට පත් භාව ප්‍රකාශනයේ වඩාත් ඇල්මක් දක්වන ශ්‍රී ලාංකික ශිල්පියා කවුද? ..........

● අංක 16 20 තෙක් දී ඇති රූපවලට ගැළපෙන රූපය A B C D E යන රූප අතුරෙන් තෝරා එයට අදාළ අක්ෂරය රූපය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

16 

(......................)



A

17 


(......................)



B

18 

(......................)



C

19  (.......................)  D

20  (.......................)  E

● අංක 21 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවලට F G H I J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

21 බුදුන්වහන්සේ වෙනුවට පැරණි කලාකරුවා බෝධිය, ඡත්‍රය, සිරිපතුල ආදී සංකේත කැටයමට නැගුහ. ඉන්දියාවේ ගෘහ නිර්මාණ අංගයක් වූ "F" රූප සටහනෙන් දැක්වෙන්නේ කුමක්ද? ..........................................................................................................

22 කොලාජ් ශිල්ප ක්‍රමය හඳුන්වාදෙමින් කරන ලද මුල්ම කලා කෘතිය "G" අක්ෂරයෙන් දැක්වේ. එහි නම කුමක්ද? ..........................................................................................

23 "H" අක්ෂරයෙන් දැක්වෙන සාරානාත් බුදුපිළිමය නිර්මාණය කර ඇති මාධ්‍ය කුමක්ද? ..........................................................................................................

24 ස්වාභාවික ලක්ෂණ වලින් යුක්ත වූ මෙය මිසර මූර්තියකි. "I" අක්ෂරයෙන් දැක්වෙන මෙහි නම කුමක්ද? ..........................................................................................

25 "J" අක්ෂරයෙන් දැක්වෙන්නේ සඟමිත් තෙරණියගේ ලංකා ගමනයයි. මෙම සිතුවම නිර්මාණය කළ ශිල්පියාගේ නම ලියන්න. ..............................................................................

- අංක 26 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා හිස් තැනට සුදුසු පිළිතුර යොදන්න.

26 පොළොන්නරුවේ දළදා මළුව යැයි සැළකෙන භූමියේ නිශ්ශංකමල්ල රජු විසින් ඉදිකරන ලද වෘත්තාකාර ගොඩනැගිල්ල ............................................ නමින් හැඳින්වේ.

27 අජන්තාවේ පළමුවන ගුහාවේ දක්නට ලැබෙන නිල්මානෙල් මලක් අතින් ගත් ආර්ය කුමරුගේ ලක්ෂණ පිළිබිඹු කරන රුව ........................................................................ වේ.

28 මිසරයේ පිරමීඩ හා දෙව් මැඳුරු අභියස අභිමානවත් ලෙස යොදා ඇති යෝධ කල්පිත මූර්තිය ........................................................................................ වේ.

29 උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත වූ පැදුරු කර්මාන්තය සඳහා භාවිතා කරන ලද්දේ ........................................................................................................ කෙඳි විශේෂයකි.

30 ''අනෝතප්ත විල'' ඉතාමත් දර්ශනීය ලෙස සිතුවම් කොට ඇති නුවර යුගයට අයත් සිතුවම ........................................................................ විහාරස්ථානයේ දැකගත හැකි වේ.

- අංක 31  35 තෙක් දී ඇති වචනවලට අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

31 මිනාර් ........................................................................................

32 සංගත වර්ණ ........................................................................................

33 යුනුස් ........................................................................................

34 වයිති ........................................................................................

35 අඛණ්ඩ කථන මාධ්‍ය ........................................................................................

- පහත දැක්වෙන කලාකෘතිය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි තේමාව, ශිල්පියා, සම්පිණ්ඩනය, ශිල්පීය කුසලතා හා ස්ථානය ආදී කරුණු ඇතුළත් වන පරිදි අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.



36 ........................................................................................................

37 ........................................................................................................

38 ........................................................................................................

39 ........................................................................................................

40 ........................................................................................................

ðÜx_ ´{ÚÆÆÌ Å`ÑÍóÚ
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2015

11 ශ්‍රේණිය

# චිත්‍ර කලාව III

කාලය පැය 2 යි.

| නම/ විභාග අංකයඃ |
| --- |

- අයදුම්කරුවන්ට උපදෙස් ඃ
- ශාලාධිපතිට භාරදෙන විට වියළීමට පත්වී ඇති ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැක.
- පහත සඳහන් ''අ'', ''ආ'', ''ඇ'' කොටස් 3 න් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන චිත්‍රණය කරන්න.

## ''අ'' කොටස - ප්‍රකාශන

01 මුහුදු වෙරළක සතුටුවන සංචාරක පිරිසක්

02 පූජණීය ස්ථානයක් වැඳපුදාගන්න පැමිණෙන බැතිමතුන්

## ''ආ'' කොටස - මෝස්තර

03 සත්ව හැඩ යෙදූ චිත්ත රෙදි මෝස්තරයක්

04 වෘත්තාකාර කුෂන් කවරයකට සුදුසු මෝස්තරයක්

## ''ඇ'' කොටස - ග්‍රැෆික්

05 පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සකස් කරන සමරු කලඹක මුල් පිටුවට සුදුසු නිර්මාණයක්

05 ''හඳුන්කූරු'' දවටනයකට සුදුසු ලේබලයක් සැලසුම් කරන්න. (ල. 30 යි.)